# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012**
**2015 මාර්තු - මැයි**

**සමාජීය විද්‍යා පීඨය**

**සමාජ විද්‍යාව - SOCI - E 2015**

**සමාජ විද්‍යාත්මක න්‍යාය**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. න්‍යාය ගොඩ නැංවීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි පෙන්වා එක් ප්‍රධාන සමාජ විද්‍යාත්මක න්‍යාය ප්‍රභේදයක් ලෙස සමපේක්ෂණාත්මක න්‍යාය හා පදනම් න්‍යාය අතර ඇති වෙනස්කම් මොනවාදැයි හඳුන්වන්න.

02. "වෙබේරියානු සමාජවිද්‍යාවේ ප්‍රධාන සාධකය ලෙස හඳුනාගත හැකිවන්නේ තාර්කිකත්වයයි.'' ඔබ මෙම කියමනට එකඟ වන්නේ ද ? හේතු දක්වන්න.

03. සමාජ පද්ධතිය හඳුනාගැනීමේ දී කෘත්‍යපූර්ව අවශ්‍යතා වැදගත් වන්නේ කෙසේද? මෙය ටැල්කොට් පාසන්ස්ගේ සමාජවිද්‍යාත්මක චින්තනය ඇසුරින් පහදන්න.

04. සට්ටනවාදී න්‍යායට එරෙහිව ඉදිරිපත් වී ඇති මූලික විවේචන මොනවාද ? එම විවේචනයන් ඔබ තෝරාගත් සට්ටනවාදී චින්තකයින් දෙදෙනෙකුගේ ඉගැන්වීම් ඇසුරින් විමසන්න.

05. සමාජයේ සමාජ ව්‍යුහය සහ සමාජ සම්බන්ධතා හඳුනා ගැනීමට මාක්ස්ගේ භෞතිකවාදී න්‍යාය ඔබ යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

06. මානව සමාජය න්‍යායාත්මකව විග්‍රහ කිරීමේ දී සම්භාව්‍ය සමාජවිද්‍යාඥයින් යොදා ගන්නා ප්‍රධාන න්‍යායාත්මක සාධකය වූයේ සමාජ පරිණාමයයි" මෙම කියමනට ඔබ එකඟ වන්නේ ද ? එවන් සමාජවිද්‍යාඥයින් දෙදෙනෙකු හඳුනාගනිමින් සමාජ වෙනස්වීම පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

07. ඔබ සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදයට අනුව මානව සමාජ අන්තර් ක්‍රියාව විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

08. පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකකට (02)</u> සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.

    1. දර්පනතල ආත්මය
    2. බහුවිධ පරිණාමවාදී න්‍යාය
    3. සමාජ පරිසිද්ධීන් (කරුණු)
    4. පරාරෝපණය

*************************